ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 පෙබරවාරි මස 17 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 පෙබරවාරි

යම් කාල පමාවක් සහිතව වුවද, පොලී අනුපාතික පහළ යාම සහ 2013 වසරේ අවසාන කාර්තුව තුළ දී පෞද්ගලික අංශයේ ණය ඉහළ යාමත් සමඟ ආර්ථිකය තවදුරටත් වර්ධනය වීමේ ලක්ෂණ පෙන්නුම් කිරීම තුළින් දැනට ක්‍රියාත්මක වන මුදල් ප්‍රතිපත්තියේ සඵලදායී බව දෘශ්‍යමාන වෙයි.

2014 ජනවාරි මාසයේ දී ද, උද්ධමනය අඛණ්ඩව 60 වන මාසයටත් තනි අංකයක මට්ටමේ පැවති අතර, මනාව කළමනාකරණය කරන ලද ඉල්ලුම් තත්ත්වයන් සහ ඉහළ ගිය දේශීය සැපයුම හේතුවෙන් 2014 වසර පුරා උද්ධමනය, මෙම මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මතුපිට උද්ධමනය, 2013 දෙසැම්බර් මස පැවති සියයට 4.7 (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) සිට 2014 ජනවාරි මාසයේ දී සියයට 4.4 ක් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ලෙස වාර්තා කරමින් තවදුරටත් අඩු විය. 2014 ජනවාරි මාසයේ දී මූලික උද්ධමනයයෙහි සියයට 3.5 ක් ලෙස (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) යම් වැඩිවීමක් වාර්තා විය.

2013 දෙසැම්බර් මාසය සඳහා දැනට ලැබී තිබෙන දත්ත අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පසුගිය මාසයෙහි පැවති සියයට 7.3 ක සිට දෙසැම්බර් මාසය තුළ දී ණය වර්ධනය සියයට 7.5 ක් දක්වා සුළු වශයෙන් වැඩිවීමත් සමඟ, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය වර්ධනයෙහි ඉහළ යාමක් පෙන්නුම් කළේය. වාණිජ බැංකු ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය අනුව, ඉහළ යන ආර්ථික ක්‍රියාකාරකම්වලට පහසුකම් සපයමින් කර්මාන්ත සහ සේවා අංශය සඳහා ලබාදුන් ණය පහසුකම්වල ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළේය. නිරපේක්ෂ අගය අනුව, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය සහ අත්තිකාරම්හි වර්ධනය පසුගිය වසරෙහි පැවති රුපියල් බිලියන 167 ට සාපේක්ෂව 2013 වසරේ දී රුපියල් බිලියන 200 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, කෘෂිකාර්මික සහ පරිභෝජනය ආශ්‍රිත උකස් ණය අත්තිකාරම් අඩු විය. ඉදිරියේ දී, 2014 වර්ෂය සඳහා පෞද්ගලික අංශය වෙත ලබාදෙන ණය සියයට

16 කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, සමස්ත පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය සියයට 14 කින් පමණ වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

2014 ජනවාරි 02 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින් අඩු කිරීමත් සමඟ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සංකෝචනය වීම සහ රජය විසින් සෙවරීන්ව බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල්වලින් කොටසක් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් වෙළෙඳපොළ ද්‍රවශීලතාව වැඩිවීම යනාදී කරුණු හේතුවෙන් වෙළෙඳපොළ පොලී අනුපාතික අඛණ්ඩවම පහත වැටුණි. තැන්පතු පොලී අනුපාතික සහ රජයේ සුරැකුම්පත් සඳහා වන පොලී අනුපාතික වර්තමාන අගයන්හි ස්ථායී වීමේ සලකුණු පෙන්නුම් කරන අතර ජනවාරි මාසයේ දී යම් පහත වැටීමක් පෙන්නුම් කළ දිගුකාලීන ණය පොලී අනුපාතිකයන් තවදුරටත් අඩුවිය හැකි අවකාශයක් පවතී.

මේ අතර, ස්ථායී විනිමය අනුපාතිකයක් සහ හිතකර ජාත්‍යන්තර සංචිත තත්ත්වයක් ඇතිකරමින් 2013 දෙසැම්බර් මාසයේ දී ගෙවුම් ශේෂයෙහි වර්තන සහ ප්‍රාග්ධන ගිණුම් දෙකම වැඩිදියුණු විය. 2013 දෙසැම්බර් මාසයේ දී අපනයන ආදායම්හි හිතකර වර්ධනයක් වාර්තා කළ අතර ආනයන අඩුවීම වෙළෙඳ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීමට හේතු විය. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම් ඉහළම මාසික අගයක් වාර්තා කළ අතර, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ද ඉහළ ගියේය.

ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව ස්ථායී සහ දිගුකාලීන දැක්මක් ඇති ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට විචක්ෂණශීලී ප්‍රතිපත්ති යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහන හීනකිරීම මඟින් ශ්‍රී ලංකා ආර්ථිකය මත ඇතිවිය හැකි බලපෑම ඉදිරියේ දී අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ තත්ත්වය දැනට පවතින දත්ත හරහා තහවුරු වන අතර, ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහන හීනකිරීම ආරම්භ වීමෙන් පසු 2014 වසරේ පෙබරවාරි 10 වැනි දින දක්වා කාලසීමාව තුළ දී ශ්‍රී ලංකා බැඳුම්කර සහ කොටස් වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 119 ක් වූ නමුත් බොහෝ නැඟීඑන ආර්ථිකයන් මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් අත්දකිමින් සිටී. අඛණ්ඩව විදේශ විනිමය ලැබීම් පිළිබිඹු කරමින් මෙම කාලසීමාව තුළ දී මහ බැංකුව ශුද්ධ පදනම මත දේශීය, විදේශ විනිමය වෙළෙඳපොළෙන් එ.ජ.ඩොලර් මිලියන 58.7 ක් අවශෝෂණය කරගත් අතර වසරේ මේ දක්වා කාලය තුළ දී රුපියල එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 0.03 කින් අධිප්‍රමාණය වෙමින් ස්ථාවරව පැවතුණි. දළ නිල සංචිතය ද, ආනයනික මාස 5.3 කට පමණ සමානව හිතකර මට්ටමක පැවතුණි.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2014 පෙබරවාරි මස 13 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සුදුසු යැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර ඒ අනුව මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙලින් සියයට 6.50 ක් සහ සියයට 8.00 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මේ අතරම, රජයේ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස මෑත කාලයේ දී ආර්ථිකයේ සමස්ත ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩි වීම මුදල් මණ්ඩලය සැලකිල්ලට ගත් අතර ආර්ථිකයේ මෙම වැඩි වූ ධාරිතාව, ආයෝජන ශක්‍යතාව සැලකිය යුතු ලෙස වර්ධනය වීමට සහ පෞද්ගලික අංශයට උපයෝගී කළ හැකි නව ආයෝජන මාර්ග විවර වීමට හේතු වී ඇත. මෙම පසුබිම යටතේ ආයෝජන ශක්‍යතාව තවදුරටත් උපයෝජනය ධෛර්යමත් කිරීම මේ අවස්ථාවේ සුදුසු යැයි මුදල් මණ්ඩලයෙහි මතය වූ අතර, රජයේ එවැනි ප්‍රතිපත්ති ඉදිරි කාලයේදී තිරසාර ආර්ථික වර්ධනය වඩාත් තීව්‍ර කරනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේදී ප්‍රකාශයට පත් කරනු ඇත.